**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.300,000 ක වියදමක් දරා ඉදිකර තිබුණු ලිහිණියාගම සතිපොළ පොදු වැසිකිළිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අදාළ විෂයන් සඳහා උපදෙස් ලබා දෙන ලදී. |
| (ii) | දෙහිඅත්තකණ්ඩිය නාගරික උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.4,000,000 ක ණය මුදලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය පොලී හා වාරික මුදල් වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මෙම ගිණුම්කරණ දෝශ නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව මෙයින් වාර්තා කරමි. |
| (iii) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉටුකරන ලද කර්මාන්ත 02 කට අදාලව ණයහිමි ප්‍රතිපාදන රු.1,223,974 ක් වැඩියෙන් සලසා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | මෙම ගිණුම්කරණ දෝශ නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව මෙයින් වාර්තා කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හිඟහිටි කර්මාන්ත ආධාර 1,288,103 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | මෙම ගිණුම්කරණ දෝශ නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව මෙයින් වාර්තා කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍යා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.346,297,801 ක වත්කම් විෂයන් 02 ක් හා රු.10,699,509 ක වගකීම් විෂයන් 01 ක් විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | එම ලේඛන ඉදිරියේදී නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන බව මෙයින් දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 04 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට සිදුකරමින් පවතින බව ඔබ වෙත වාර්ථා කරමි. |
| (ආ) | 2015 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගර්හිත තත්ත්වයේ පැවති වාහන 05 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම වාහන අප ආයතනයට වෙනත් ආයතන මගින් ද ලබා දී ඇති අතර එම වාහන සෘජුව අප ආයතනය මගින් අපහරණය කිරීමට නොහැකි බැවින් පවරාගැනීම් සඳහා අදාල ආයතනයන් වෙත දන්වා ඇත. ඉදිරියේදී ඉතිරි පැවරුම් හා අපහරණ කාර්යයන් සිදුකරන බව කාරුණිකව දන්වමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,044,210 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,071,890 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 1,528,956 | 1,415,901 | 1,047,372 | 1,938,758 | 1,488,956 | 1,728,772 | 1,466,069 | 2,555,273 |
| කුලී | 10,956,537 | 8,898,088 | 8,396,963 | 501,125 | 10,343,566 | 9,616,676 | 8,970,726 | 1,087,200 |
| බලපත්‍ර ගාස්තු | 1,770,500 | 1,846,678 | 1,827,928 | 18,750 | 1,510,600 | 1,875,050 | 1,833,700 | 57,350 |
| වෙනත් ආදායම් | 4,056,000 | 6,265,109 | 5,742,643 | 510,398 | 1,864,000 | 269,335 | 3,604,485 | 187,270 |
| | **18,311,993** | **18,425,776** | **17,014,906** | **2,969,031** | **15,207,122** | **13,489,833** | **15,874,980** | **3,887,093** |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් රු.1,938,758 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා කරමි. |

#### 2.2.3 කුලී ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.501,125 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී ගාස්තු අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා කරමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.336,833 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ අයකරගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා කරමි. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 01 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | කසළ කළමනාකරණ සඳහා පමණක් සම්මත අතුරු ව්‍යවස්ථා ඇත. නමුත් අනෙකුත් පොදු කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාළ සකස් කිරීම් සිදුකර පළාත් සභාව වෙත යොමුකර ඇතත් එය මෙතෙක් ඉටුවී නොමැත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක දැනුවත් වී ඇති අතර එම ඉලක්කයන්ට අනුව කටයුතු කිරීමට කටයුතු සිදුකරන බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු වේ. | කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීම් හා තවදුරටත් අත්‍යාවශ්‍ය තනතුරු ඉල්ලා යවා ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති අතර දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත්ද නොවේ. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභාව විසින් අවසන් වරට වරිපනම් තක්සේරුව සිදුකළ 2011 වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් අයකර තිබුණි. | නව තක්සේරුවක් සිදුකර වරිපනම් බදු අයකර ගත යුතු වේ. | නමුත් මෙම තක්සේරුව විවිධ අවස්ථාවල නැවත තක්සේරු කිරීම් සඳහා නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමුකර ඒ සඳහා අනුමැතියද ලැබී ඇතිමුත් නැගෙනහිර පළාත් තක්සේරු දෙපාර්තමේන්තු මගින් එය දිගින් දිගටම ප්‍රමාද කර ඇති බැවින් මේ වන විටත් මෙම කාර්යය සිදුකර ගැනීමට නොහැකි වී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාව විසින් නව තක්සේරු වටිනාකම් ලබා ගැනීමට කටයුතු නොකර 2008 වර්ෂයේ සිදුකළ කඩකාමර තක්සේරුව මත සභාව සතු කඩකාමර 05 කින් සමාලෝචිත වර්ෂයේදී ද කඩකාමර කුලී අයකර තිබුණි. | නව තක්සේරුවක් සිදුකර කඩකාමර කුලී අයකර ගත යුතු වේ. | එම කඩ කාමර 05 සඳහා ද අදාළ තක්සේරු කිරීම් අදාළ දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇතිමුත් මෙතෙක් ඒ සඳහා වාර්තා ලබා දී නොමැත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**පවරා නොගත් වත්කම්**

**------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මහවැලි අධිකාරිය හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ප්‍රාදේශීය සභාවට ලබා දුන් වාහන 05 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගත යුතු වේ. | මේ යටතේ සඳහන් වාහන වර්ග 05 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් දෙකක් හා ඔබදව් ආයතනය වෙතින් 03ක් ලබා දී ඇති මුත් මෙතෙක් මෙම වාහන අදාළ ආයතන මගින් අප ආයතනයට පවරා දී නොමැත. එබැවින් එම වාහන වල පැවරීම් මෙතෙක් ප්‍රමාද වී ඇති බව දන්වමි. |
| (ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු භූමි ප්‍රමාණය, හෙක්ටයාර් 1.72 ක් වූ ඉඩම් කැබලි 04 ක, ක්‍රීඩා පිටි 07 ක හා සුසාන භූමි 37 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් වල නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගත යුතු වේ. | මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව වාර්තා කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**--------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**----------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අනුමත අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය සඳහා අප ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොමැති වුවද එය මේ වන විට සකස් කර ඇති බව මෙයින් වාර්තා කරමි. |